# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,475 - 2026 පෙබරවාරි මස 06 සිකුරාදා - 2026.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 544 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 559 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 27 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 13 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2026 ජනවාරි මස 02 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ සහකාර තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

තොරතුරු තාක්ෂණ සහකාර (තනතුර 01)

සුදුසුකම් :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස : අවුරුදු 22 නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

වැටුප් ක්‍රමය : MA 2-1 -2025 - රු. (50,540-10x540-7x630-4x890-20x1,190-රු. 87,710)

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කාර්ය සාධනය | ලකුණු 25 |
| | **මුළු ලකුණු** | **100** |

පොදු කොන්දේසි :

1. රාජ්‍ය හෝ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 දරන රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීතිරීතිවලට යටත් වේ.
3. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
4. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
5. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් තම සහතිකවල ඡායා පිටපත් සමඟ තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් **2026.02.27 දින පෙ. ව. 4.00**ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතු යි. කවරයේ වම් කෙළවරෙහි "තොරතුරු තාක්‍ෂණ සහකාර තනතුර" ලෙස සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම
පිළිබඳ කොමිෂන් සභාව.

කාමර අංක 203,
ගොඩනැගිලි අංක 02,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

02 - 78/1

---

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

අධ්‍යක්ෂ (නීති) (තනතුරු 01)

සුදුසුකම් :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම;

*සහ*

නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (Master of Law) සුදුසුකම් ලබා තිබීම;

*සහ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නීති කෘත්‍යයන් සඳහා පෙනී සිටීම ඇතුළත් ව තනතුරට අදාළව නීති ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

වයස : අවුරුදු 35 නොඅඩු හා 55ට නොවැඩි විය යුතු ය.

වැටුප් ක්‍රමය : HM 1-1 -2025 - රු. (140,640-15x4,100-රු. 202,140)

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| | | |
|---|---|---|
| 01. | අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කාර්ය සාධනය | ලකුණු 25 |
| | **මුළු ලකුණු** | **100** |

පොදු කොන්දේසි

1. රාජ්‍ය හෝ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 දරන රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීතිරීති වලට යටත් වේ.
3. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
4. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
5. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් තම සහතිකවල ඡායා පිටපත් සමඟ තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් **2026.02.27 දින ප. ව. 4.00**ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතු යි. කවරයේ වම් කෙළවරෙහි "අධ්‍යක්ෂ (නීති)" ලෙස සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම
පිළිබඳ කොමිෂන් සභාව.

කාමර අංක 203,
ගොඩනැගිලි අංක 02,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

02 - 78/2

---

## වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

### සමාගම් පරීක්ෂක නිලධාරි තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු 02ක් සීමිත පදනමින් සම්පූර්ණ කිරීම සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් දැනට සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(01) **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත උපරිම සුදුසුකම් ඇති අපේක්ෂකයන් දෙදෙනකු සමාගම් පරීක්ෂක නිලධාරි තනතුරට බඳවාගනු ලැබේ.

එහි දී අංක 06 යටතේ සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**(02) අවශ්‍ය සුදුසුකම් :**

2.1 බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :

2.1.1 MN -02 වැටුප් කාණ්ඩයේ හෝ ඊට ඉහළ කාණ්ඩයකට අයත්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධිධාරියෙක් වීම;

*හෝ*

2.1.2 MN -02 වැටුප් කාණ්ඩයේ හෝ ඊට ඉහළ වැටුප් කාණ්ඩයකට අයත්, වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත අ.පො.ස. (උසස් පෙළ) සමත් නිලධාරියෙක් වීම. (සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.)

2.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

2.3 වෙනත් :

2.3.1 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

2.3.2 සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05ක් තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.3.3 අයදුම්පත් කැඳවන අවසන් දිනට මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(03) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

i. මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරු, රාජ්‍ය සේවයේ පත්වීම් සඳහා බලපාන පොදු කොන්දේසි මත, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරි තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියෙහි කොන්දේසිවලට යටත් විය යුතු ය.

ii. මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තව ද වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

iii. මෙම පත්වීම වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත්ය. සමාගම් පරීක්ෂක නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

iv. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**(04) වයස් සීමාව**

අදාළ නොවේ.

**(05) වැටුප් පරිමාණය**

මෙම තනතුරට රු. 53,060 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 – 5 x 1,350 – 94,100/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අංක MN – 4 - 2025 වැටුප් කාණ්ඩය වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

**(06) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ:-

**සමාගම් පරීක්ෂක නිලධාරි තනතුර - යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු පටිපාටිය**

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **01.** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | **30** |
| | *a)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිවේදී උපාධිය; | 30 | |
| | *b)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් වෙනත් උපාධියක්; | 25 | |
| | *c)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ගන්නා ලද ඩිප්ලෝමාවක්; | 20 | |

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| | *d*) අ.පො.ස. උසස් පෙළ විභාගයේ ලබාගෙන ඇති සාමාර්ථ අනුව-<br>i. සම්මාන සාමාර්ථ තුනක් හෝ ඊට ඉහළ සාමාර්ථ තුනක් ලබා ගෙන තිබීම;<br>ii. සම්මාන සාමාර්ථ දෙකක් හා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ගෙන තිබීම;<br>iii. සම්මාන සාමාර්ථයක් හා සාමාන්‍ය සාමාර්ථ දෙකක් ලබාගෙන තිබීම;<br>iv. සාමාන්‍ය සාමාර්ථ තුනක් ලබා ගෙන තිබීම; | <br>15<br>12<br>08<br>05 | |
| | *සටහන* I: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ තනතුරකට බඳවා ගැනීමේ දී හෝ එම දෙපාර්තමේන්තු සේවයේ උසස් කිරීමක දී හෝ කාර්යක්ෂමතා කඩඉමකින් සමත් කිරීමක දී / නිදහස් කිරීමක දී සුදුසුකමක් ලෙස දැනටමත් සලකා ඇති සුදුසුකම් සඳහා නැවත ලකුණු හිමි නොවේ.<br>*සටහන* II: ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| **02.** | **වෘත්තීය සුදුසුකම්** | | **10** |
| | (*a*) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ,<br>i. සමාගම් පරීක්ෂක අංශයේ සේවය කර තිබීම<br>ii. සමාගම් අංශයක සේවය කර තිබීම<br>iii. වෙනත් අංශයක සේවය කර තිබීම<br>(*b*) පසුගිය වසර 03ක සිට වෙනත් ආයතනයක සේවය කිරීම. | <br>10<br>08<br>05<br>02 | |
| | *සටහන* I: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු සේවයේ උසස් කිරීමක දී හෝ කාර්යක්ෂමතා කඩඉමකින් සමත් කිරීමක දී / නිදහස් කිරීමක දී සුදුසුකමක් ලෙස දැනටමත් සලකා ඇති සුදුසුකම් සඳහා නැවත ලකුණු හිමි නොවේ.<br>*සටහන* II: ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | | |
| **03.** | **පළපුරුද්ද** | | **20** |
| | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හි විධිවිධාන පරිදි ලකුණු ලබාදෙනු ලැබේ. | | |
| **04.** | **භාෂා ප්‍රවීණතාවය** | | **20** |
| | *a*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 4 මට්ටමේ සහතිකයක් | 20 | |
| | *b*) අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉඑළ සාමාර්ථයක් ලබා තිබීම. | 15 | |
| | *සටහන* I: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු සේවයේ උසස් කිරීමකදී හෝ කාර්යක්ෂමතා කඩඉමකින් සමත් කිරීමකදී / නිදහස් කිරීමකදී සුදුසුකමක් ලෙස දැනටමත් සලකා ඇති සුදුසුකම් සඳහා නැවත ලකුණු හිමි නොවේ.<br>*සටහන* II: ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | | |
| **05.** | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :** | | **15** |
| | *a*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා; | 15 | |

| අනු. අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| | *b*) රජය පිළිගත් ආයතනයක අවුරුදු එකකට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 10 | |
| | *c*) රජය පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | මාස 06/ පැය 720 | 08 | |
| | මාස 03/ පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |
| **06.** | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය**<br><br>තනතුරෙහි කාර්යභාරයට අදාලව අයදුම්කරුගේ අභිප්‍රේරණය (ලකුණු 0.5) අවස්ථානුකූල කුසලතා (ලකුණු 1.0) හා දක්ෂතා (ලකුණු 3.5) ඇගයීමට ලක්කර ලකුණු ලබාදෙනු ලැබේ. | | **05** |
| **එකතුව** | | | **100** |

*සටහන* - යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතිකපත්‍රවල අදාල කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතිකපත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් වලට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු නොලැබේ.
යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණුවල ප්‍රමුඛතාවය අනුව පත්වීම ලබාදෙනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පත්වීම ලබාගැනීමට හිමිකමක් නොවන බවද සැලකිය යුතු ය.

**(07) අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛනවලට ලකුණු ලබා දෙනු නොලැබේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් කවරක් හෝ පිළිගනු ලැබේ:-

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු රියදුරු බලපත්‍රය.

**(08) අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය:**

i. අයදුම්පත් 2026.03.09 දිනට හෝ ඊට ප්‍රථම "සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, අංක 400, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10." යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 02 දක්වාත් 02 පිටුව 03 සිට 05 දක්වාත් 03 පිටුව 06 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත්අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "සමාගම් පරීක්ෂක නිලධාරි තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

iii. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**(09)** සාවද්‍ය තොරතුරු සැපයීම:-

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**(10)** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**(11)** මෙම නිවේදනයේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**(12)** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
2026 ජනවාරි මස 30 දින.

ආදර්ශ අයදුම්පත

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත පදනමින් බඳවා ගැනීම - 2026**

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):Mr./ Mrs./Miss. ____________________.
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) සිංහලෙන්/දෙමළෙන් : ____________________ මයා/මිය/මෙනවිය

02. (i) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ____________________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) ස්ථිර ලිපිනය : ____________________.

ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ____________________.

සිංහලෙන්/දෙමළෙන් : ____________________.

(iii) රාජකාරී ලිපිනය : ____________________.

ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ____________________.

03. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
[ ]

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

04. (i) ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05. (i) උපන් දිනය :

අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස (2026. දිනට වයස) :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

06. (i) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා/පෙළ) විභාගය පැවැත්වූ

වර්ෂය හා මාසය : ____________________________________.

විභාග අංකය : ____________________________________.

| | *සමත් වූ විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

අ.පො.ස.(උ/පෙළ) විභාගය පැවැත්වූ

වර්ෂය හා මාසය : ____________________________________.

විභාග අංකය : ____________________________________.

| | *සමත් වූ විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

උපාධිධාරියකු නම් පහත සඳහන් විස්තර සපයන්න.

I. උපාධියේ නම හා වලංගු වන දිනය :-
II. විශ්වවිද්‍යාලය/ ආයතනය :-
III. සමත්වූ පන්තිය :-

(ii) වෘත්තීය සුදුසුකම් :

| *ඩිප්ලෝමා/වෘත්තීය සහතිකයේ නම* | *පාඨමාලාව හැදෑරූ කාලය සිට-දක්වා* | *පාඨමාලාවේ වසර ගණන* | *නිකුත් කළ ආයතනයේ නම* |
|---|---|---|---|
| | | | |
| | | | |

(iii) වෙනත් සුදුසුකම් ( පරිගණක හැකියාව / දෙමළ - ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා ආදිය)
.......................................................................................................................
....................................................................................................

07. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? දඬුවම් ලබා ඇත්නම් නඩු අංකය, දෙන ලද දඬුවම් ගැන විස්තර සඳහන් කරන්න. : ______________________________.

08. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය : ______________________________.
ගෙවූ මුදල රු. : ______________________________.
කුවිතාන්සි අංකය : ______________________________.
දිනය : ______________________________.

| |
|---|
| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

09. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............................. .......... හා ............................ දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර, එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

..............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය:- .............................

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත්කරනු ලබන ................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා , එම ලදුපත අලවා ඇති බවත්, .......................... දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත් මම සහතික කරමි.

.....................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :- ................................

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :- .....................................................................
තනතුර :- .....................................................................
ලිපිනය :- .....................................................................
(නිල මුද්‍රාව තබන්න)

11. ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..............................මයා/මිය/මෙනවිය ................................ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ............................... ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

..............................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ..........................................
නම : ..........................................
තනතුර : ........................................
ලිපිනය : .........................................
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

02-79

---

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

### ඒකාබද්ධ සේවයේ කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා ආයතනවල ඒකාබද්ධ සේවයේ කාර්යාල සේවක සේවය III ශ්‍රේණියේ පුරප්පාඩු 240ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්කිරීමේ බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්කිරීමේ බලධරයාට බලය ඇත. පුරප්පාඩු පවතින ආයතන ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

03. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහතින් දක්වා ඇති ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත අදාළ සහතිකවල පිටපත් ද සමඟ බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීමේ අයදුම්පත"** යනුවෙන් සඳහන් කර **2026.02.23** දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

04. තනතුරේ ස්වභාවය සහ රාජකාරි ව්‍යුහය :

I. මෙම තනතුර ප්‍රාථමික ශිල්පීය නොවන ගණයේ තනතුරකි.

II. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ.

III. ඔබ වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

IV. පත්වීම භාරගත් දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් විය යුතුය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතුය.

V. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ වෙනත් රෙගුලාසි චක්‍රලේඛ උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් විය යුතු වේ.

05. ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා වන පොදු මූලික අවශ්‍යතාවයන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ නිපුණතාවයකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහුකාර්ය සේවා ගණයකි. සේවා ව්‍යවස්ථාව අනුව III ශ්‍රේණිය සඳහා නියමිත තනතුර වනුයේ කාර්යාල සේවක සේවයේ කාර්යාල කම්කරු වේ. මෙම කාර්ය පථයට අයත් ඕනෑම කාර්යභාරයක් ආයතන ප්‍රධානියා / පත්කිරීමේ බලධාරියා විසින් සේවා ගණයට පවරනු ලැබේ.

*උදාහරණ* -

යතුරු රාජකාරි, ලිපි හා ලිපිගොනු රැගෙන යාම, අවශ්‍යතාවය පරිදි පවිත්‍රතා කටයුතු සිදුකිරීම, ඡායා පිටපත් ලබාගැනීම සඳහා සහය වීම, ෆැක්ස් පණිවිඩ සම්බන්ධ කටයුතු හා ආයතනයට අදාළව පවරනු ලබන රාජකාරි කටයුතු.

**06. සේවා කොන්දේසි :**

I. පත්වීම ලැබූ පළමු සේවා ස්ථානයේ අවම වසර 03ක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධරයකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

II. මෙම පත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2310/29 හා 2022.12.14 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් කරුණු ද අදාළ වේ.

**07. බඳවා ගැනීමේ සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

IV. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

V. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබීම.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

VII. තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*සටහන* -

මෙම බඳවා ගැනීම හුදෙක් කාර්යාල සේවක සේවයේ රාජකාරි ඉටු කිරීම සඳහා වන බැවින්, ඉහළ අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම මත, කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථාවෙන් පරිබාහිරව විධිමත් පටිපාටියකින් තොරව වෙනත් වැටුපක් ලබා ගැනීමට හෝ එබඳු වැටුප් ව්‍යුහයක වන තනතුරකට පත් කිරීමට හිමිකමක් නොමැති බව සැලකිය යුතුය.

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

I. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ කාර්යාල කම්කරු තනතුරට පත්කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන පටිපාටිය පහත වගුවේ පරිදි වේ.

| ***නිර්ණායකය*** | | ***ලකුණු*** |
|---|---|---|
| ලබා ඇති වෘත්තීය සුදුසුකම් | | 5 |
| සන්නිවේදන හැකියාව | | 10 |
| අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සමත්ව තිබීම. | 5 |
| | අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ගණිතය, භාෂාව, දෙවැනි රාජ්‍ය භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ වෙනත් භාෂා සඳහා සාමාර්ථයක් ලබා තිබීම (එක් භාෂාවක් සඳහා ලකුණු 2 බැගින් උපරිම විෂයයන් 5ක් සළකා බලනු ලැබේ.) | 10 |
| පෞරුෂය | | 5 |

| *නිර්ණායකය* | *ලකුණු* |
|---|---|
| බාහිර ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සමාජසේවා ......... යනාදී) | 5 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 10 |
| **මුළු ලකුණු** | **50** |

**09.** වැටුප **:**

I. වැටුප් කේතය - **PL-1-2025**

II. වැටුප් පරිමාණය, III, II, හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය - රු. **40,000 – 10 X 450 – 10 X 490 – 10 X 540 – 12 X 590 –** රු.**61,880/ =**කි.

(2027.01.01 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ. එතෙක් මෙම චක්‍රලේඛයෙහි උපලේඛන III අනුව නියමිත වැටුප ගණනය කරනු ලැබේ.)

10. අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන :

I. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්,

II. ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්,

III. අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්,

IV. ග්‍රාම නිලධාරි සහතිකය (DS 04 ආකෘතිය).

11. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

I. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

15. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරි තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි,

.............................................................

**ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන,**
ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා
අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 30 වැනි දින,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ඇමුණුම 02

ආදර්ශ අයදුම්පත්‍රය

**ඒකාබද්ධ සේවයේ කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

අයදුම්කරන භාෂා මාධ්‍යය:

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

1. මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ……………………………………………......………මයා/මිය/මෙය
2. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : Mr./ Mrs. / Miss ……………………………………………………
3. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..........................................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

5. උපන් දිනය: : වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]
6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (..................) වයස: අවු: [ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]
7. ස්ථිර ලිපිනය : ..........................................................................................................................
8. පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................................................................
9. අධ්‍යාපන සුදුසුකම් :

I. පළමුවර ප්‍රතිඵල: වර්ෂය ...................... මාසය ...................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. දෙවනවර ප්‍රතිඵල: වර්ෂය ...................... මාසය ...................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

9.1. අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

විභාගයේ වර්ෂය සහ මාසය : ..................................... විභාග අංකය : .....................................

**ප්‍රතිඵල**

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

**10.** **වෙනත් සුදුසුකම් :**

..........................................................................................................................................................................................

..........................................................................................................................................................

**11.** **තනතුර අදාළව ලබා ඇති පළපුරුද්ද :**

..........................................................................................................................................................................................

..........................................................................................................................................................

**12.** **ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් :**

..........................................................................................................................................................................................

..........................................................................................................................................................

13. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐

**14.** **අයදුම්කරුගේ සහතිකය :**

*අ.* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*ආ.* මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

*ඇ.* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : .............................................. ..............................................

අයදුම්කරුගේ අත්සන

ඇමුණුම 0 1

**කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම**

| *අනු. අංකය* | *අධිකරණය* | *බඳවා ගැනීමට යෝජිත ගණන* |
|---|---|---|
| 1 | අමාත්‍යාංශය | **5** |
| 2 | ශ්‍රේෂ්ඨාධිකරණය | **4** |
| 3 | අභියාචනාධිකරණය | **10** |
| 4 | **කොළඹ මහාධිකරණය** | **10** |
| 5 | කොළඹ දිසා අධිකරණය | **6** |
| 6 | කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය | **4** |
| 7 | කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |

| අනු. අංකය | අධිකරණය | බඳවා ගැනීමට යෝජිත ගණන |
|---|---|---|
| 8 | කොළඹ වාණිජ මහාධිකරණය | **2** |
| 9 | මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 10 | බත්තරමුල්ල ළමා මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 11 | ගල්කිස්ස දිසා අධිකරණය | **2** |
| 12 | ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 13 | නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 14 | **ගම්පහ මහාධිකරණ 02** | **3** |
| 15 | ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 16 | මහර මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 17 | මහර දිසා අධිකරණය | **1** |
| 18 | **මීගමුව මහාධිකරණය** | **1** |
| 19 | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 20 | මීගමුව සිවිල් අභියාචනා මහාධිකරණය | **2** |
| 21 | වැලිසර දිසා අධිකරණය | **1** |
| 22 | වැලිසර මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 23 | **කළුතර මහාධිකරණය** | **1** |
| 24 | කළුතර දිසා අධිකරණය | **1** |
| 25 | කළුතර මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 26 | පානදුර මහාධිකරණය | **1** |
| 27 | පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 28 | හොරණ දිසා අධිකරණය | **1** |
| 29 | හොරණ මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 30 | මතුගම දිසා අධිකරණය | **1** |
| 31 | මතුගම මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 32 | කැස්බෑව දිසා / මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 33 | **ගාල්ල මහාධිකරණය** | **2** |
| 34 | ගාල්ල දිසා අධිකරණය | **2** |
| 35 | ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 36 | බලපිටිය මහාධිකරණය | **3** |
| 37 | බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 38 | උඩුගම දිසා / මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 39 | මාතර දිසා අධිකරණය | **3** |

| අනු. අංකය | අධිකරණය | බඳවා ගැනීමට යෝජිත ගණන |
|---|---|---|
| 40 | වලස්මුල්ල දිසා / මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 41 | හම්බන්තොට මහාධිකරණ | **1** |
| 42 | කුරුණෑගල සිවිල් අභියාචනා මහාධිකරණය | **1** |
| 43 | කුලියාපිටිය දිසා අධිකරණය | **1** |
| 44 | නාරම්මල මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 45 | ගල්ගමුව දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 46 | නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 47 | පොල්ගහවෙල මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 48 | හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 49 | **අනුරාධපුරය මහාධිකරණය** | **3** |
| 50 | අනුරාධපුරය දිසා අධිකරණය | **2** |
| 51 | කැබිතිගොල්ලෑව දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 52 | මැදවච්චිය මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 53 | **මහනුවර මහාධිකරණ 02** | **2** |
| 54 | මහනුවර සිවිල් අභියාචනා මහාධිකරණය | **1** |
| 55 | මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 56 | ගලගෙදර මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 57 | මාතලේ මහාධිකරණය | **2** |
| 58 | හැටන් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 59 | **හලාවත මහාධිකරණය** | **1** |
| 60 | මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 61 | පුත්තලම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 62 | වරකාපොළ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 63 | **හෝමාගම අතිරේක මහාධිකරණය** | **1** |
| 64 | හෝමාගම සිවිල් අභියාචනා මහාධිකරණය | **1** |

| අනු. අංකය | අධිකරණය | බඳවා ගැනීමට යෝජිත ගණන |
|---|---|---|
| 65 | කඩුවෙල දිසා අධිකරණය | **1** |
| 66 | **බදුල්ල මහාධිකරණය** | **1** |
| 67 | බදුල්ල දිසා අධිකරණය | **1** |
| 68 | **යාපනය මහාධිකරණය** | **3** |
| 69 | යාපනය සිවිල් අභියාචනා මහාධිකරණය | **2** |
| 70 | යාපනය දිසා අධිකරණය | **2** |
| 71 | යාපනය මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 72 | යාපනය ළමා මහෙස්ත්‍රාත් අධිකරණය | **4** |
| 73 | කයිට්ස් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **2** |
| 74 | මල්ලාකම් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **3** |
| 75 | පේදුරුතුඩුව දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය | **3** |
| 76 | චාවකච්චේරි දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය | **4** |
| 77 | මන්නාරම මහාධිකරණය | **2** |
| 78 | මන්නාරම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **3** |
| 79 | **කිලිනොච්චිය මහාධිකරණය** | **4** |
| 80 | කිලිනොච්චිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **5** |
| 81 | මුලතිව් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 82 | අම්පාර සිවිල් අභියාචනා මහාධිකරණය | **1** |
| 83 | කල්මුණ දිසා අධිකරණය | **1** |
| 84 | පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 85 | **මඩකලපුව මහාධිකරණය** | **3** |
| 86 | මඩකලපුව සිවිල් අභියාචනා මහාධිකරණය | **2** |
| 87 | මඩකලපුව දිසා අධිකරණය | **1** |
| 88 | මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණය | **3** |
| 89 | **ත්‍රිකුණාමලය මහාධිකරණ** | **3** |
| 90 | ත්‍රිකුණාමලය දිසා අධිකරණය | **2** |
| 91 | ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| 92 | මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |

| අනු. අංකය | අධිකරණය | බඳවා ගැනීමට යෝජිත ගණන |
|---|---|---|
| | | |
| | **නව අධිකරණ** | |
| | කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණය | **2** |
| | මීගමුව මහාධිකරණය | **5** |
| | මහියංගනය දිසා අධිකරණය | **5** |
| | මහියංගනය මහෙස්ත්‍රාත් අධිකරණය | |
| | අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණය | **1** |
| | කිලිනොච්චිය ළමා මහෙස්ත්‍රාත් අධිකරණය | **3** |
| | නව මහාධිකරණ 05 | **30** |
| | | **240** |

02-102

---

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ, විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ ව්‍යවස්ථාව යටතේ, විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා පහත සඳහන් පත්වීම් සඳහා සුදුසු තැනැත්තන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කළ යුතු ය:

I. නියෝජ්‍ය විගණකාධිපති ධුරය හෝ ඊට ඉහළින් වූ ධුරයක් දරන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙක්;

II. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙක්;

*සහ*

III. ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාමලත් I පන්තියේ නිලධරයෙක්.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ 'විගණන සේවා

කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම' නමින් පළකර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 පෙබරවාරි මස 20** දින හෝ එදිනට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil @parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරනු ලැබිය යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපිනයෙහි විෂයය වශයෙන් 'විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,

2026 පෙබරවාරි මස 05 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

02 - 141

---

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවී තිබෙන පුරප්පාඩුව සහ ඉදිරියේ ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාව යටතේ මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ ව්‍යවස්ථාව යටතේ, කොමිෂන් සභාවේ යටත් පිරිසෙන් සාමාජිකයින් තිදෙනෙකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ 'ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම' නමින් පළකර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 පෙබරවාරි මස 20** දින හෝ එදිනට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil @parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරනු ලැබිය යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපියෙහි විෂයය වශයෙන් 'ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,

2026 පෙබරවාරි මස 05 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

02 - 142

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සංශෝධනයයි**

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2025

අංක 2468 දරන 2025 දෙසැම්බර් මස 19 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2025 පහත පරිදි සංශෝධනය වේ.

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2025(2026)**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීමට 2026 වර්ෂයේ කොළඹ දී පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගයට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

10. ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර:

(අ.) I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21 x 29 (A4) ප්‍රමාණයේ

කඩදාසිවල තමන් ඉල්ලුම්පත්‍ර සකසා ගත යුතු අතර ඉල්ලුම්පතේ 01 පිටුව අංක 01 සිට 04 දක්වාත්, 02 පිටුව අංක 05 සිට 09 දක්වාත්, 03 පිටුව අංක 10 සිට 12 දක්වාත් ඡේදයන් ඇතුලත් විය යුතු අතර විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර - විවෘත" යනුවෙන් සඳහන් කර **2026.02.28** දින හෝ ඊට පෙර සර්වේයර් ජනරාල්, විභාග අංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැ.පෙ. 506, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතු ය.)

II. අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. තැපෑලේ දී අස්ථානගතවන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

IV. මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකරයි.

V. ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(*ආ.*) ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ශ්‍රේණිගත කිරීම අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය හැක.

13. විභාග ගාස්තුව රු.800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවා ලබා ගත් රිසිට්පත, අයදුම්පතේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතු ය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

13.1 Govpay.lk මගින්ද ගෙවීම් සිදුකළ හැක.(යොමු අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකයද සේවාව ලෙස විභාග ගාස්තුද යන්න ඇතුලත් කරන්න.)

*සටහන*:

අංක 2468 දරන 2025 දෙසැම්බර් 19 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2025 සඳහා දැනටමත් අයදුම් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

එන්. කේ. යූ. රෝහණ,
සර්වේයර් ජනරාල්.

2026 ජනවාරි මස 27 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

02-30

---

## සංශෝධනයයි

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

අංක 2468 දරන 2025 දෙසැම්බර් 19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 පහත පරිදි සංශෝධනය වේ.

**කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025(2026)**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට 2026 වර්ෂයේ **කොළඹ දී** පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

5.0 සුදුසුකම් :-

5.1 සියලු තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් :

සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන් දෙක (02) සහිතව විද්‍යා/ගණිත

විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

5.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.3 වෙනත්:

(i.) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii.) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii.) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv.) සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

11.0 විභාග ගාස්තුව:

11.1 විභාග ගාස්තුව රු. 800 කි.මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබා ගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.2 **Govpay.lk** මගින් ද ගෙවීම් සිදුකළ හැක. (යොමු අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකය ද සේවාව ලෙස විභාග ගාස්තු යන්න ද ඇතුලත් කරන්න.)

12.0 අයදුම්පත් යොමු කිරීම :

12.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.02.28** දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 506,
කොළඹ 05.

12.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඉන් පෙර ඉදිරිපත් කළ යුතු වේ.

12.3 අයදුම්පත බහා එවන කවරයේ වම් පස කෙළවරේ **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ - විවෘත තරග විභාගය 2025(2026)** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

***සැ.යු.*** **2026.02.28 දිනෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර ගනු නොලැබේ.**

12.4 ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 3-4ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් ඒ බව තමන් ළඟ තබා ගත් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් සමඟ දෙපාර්තමේන්තුවේ විභාග අංශය විමසිය යුතු ය.

*සටහන:* අංක 2468 දරන 2025 දෙසැම්බර් මස 19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 සඳහා දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

එන්. කේ. යූ. රෝහණ,
සර්වේයර් ජනරාල්.

2026 ජනවාරි මස 27 දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

02-31

---

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

**01.** ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුමත සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් **2026 මැයි මාසයේ** දී පවත්වනු ලබනු බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ අපගේ සේවාවන් (Our services) යටතේ Online Applications (Recruitment/E.B.Exams) මුහුණත මඟින් පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. පළමුවන වරට විභාගයට පෙනී සිටින නිලධාරීන් හා ඉන්පසු වාරවල දී ඉදිරිපත් වන නිලධාරීන් තමා පෙනී සිටින වාරය නිවැරදිව තෝරා ගත යුතුය. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ වෙනත් තොරතුරු අයදුම්කරුගේ සහතිකය අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය යන කොටස් සම්පූර්ණ කර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර **"විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත. බත්තරමුල්ල"** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ග්‍රාම නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026 මාර්තු මස 09 දින වේ.**

***සටහන -*** අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේ දී නැති වූ බවට ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය. (බාගත කර ගන්නා අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

**02.** මෙම විභාගය ග්‍රාම නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පහත සඳහන් වගු අංක 01 හි සඳහන් නගරවලදී පමණක් පැවැත්වේ. එම නගරවලට අදාළ නගර අංක පහත වගුවේ දැක්වෙන අතර අයදුම්පතේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම අයදුම්කරුවන් ඔවුන්ගේ ඊට ආසන්න දෙවන මනාපය යටතේ දක්වන ලද නගරයේ හෝ වෙනත් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කෙරෙනු ඇත.

තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

වගු අංක 01 : විභාගය පැවැත්වෙන නගර හා නගර අංක

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුර | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

**03.** (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට් පත්‍රයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

**04.** සුදුසුකම් - මේ වන විට ග්‍රාම නිලධාරි II ශ්‍රේණියේ සිටින නිලධාරින් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

**05.** විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**06.** (i) අයදුම්පත් - මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපැලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව, එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(iii) පළමුවන වරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන් පසු වාරවල දී නිලධාරින් විසින් එක් විෂයයකට රු. 250/- බැගින් ගෙවිය යුතු වේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. බැංකු ණය කාඩ් පත් මගින් (Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රිය කර ඇති ඕනෑම හර කාඩ්පතක් මගින් (Bank Debit Card with Internet Bank Facility)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Bank of Ceylon Online Banking Method)
iv. ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Slip Payment)

***සටහන -*** *ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.*

ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

**07.** *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත්

අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත / විභාග ගාස්තු ගෙවීම අදාළනම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශපත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

*සටහන* - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

**08.** විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය.

**09.** විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**10.** සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**11.** තමන් කැමැති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථ්‍ය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලු විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

**12.** විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

**13.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර, මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේය. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

**14.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** *විභාග පටිපාටිය :* අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

**වගු අංක 02 : විභාගය පැවැත්වෙන විෂයයන් සහ අදාළ වන අනෙකුත් විස්තර**

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | 100 | පැය 01 1/2 | 1 |
| 2. | විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම | 100 | පැය 01 1/2 | 2 |

**15.1 කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති**

(අ) <u>කාර්යාල ක්‍රම</u>

රජයේ කාර්යාලවල හා ග්‍රාම නිලධාරි කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.

(ආ) <u>ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ VII, IX, XI, XII, XIV, XV, XVI, XVII, XXI, XXII, XXIII, XXIV, XXV, XXVI, XXVII,

XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේදවල සඳහන් විධිවිධාන සහ තත්කාලීනව භාවිත වන රාජ්‍ය පරිපාලන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක්කෙරේ.

**15.1.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර :**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

| | |
|---|---|
| I වන කොටස | - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25) |
| II වන කොටස | - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතු ය. කාලය පැය 01යි. (ලකුණු 75යි) |

**15.2 විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම :**

ග්‍රාම නිලධාරින්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් ව්‍යවස්ථාපිත රජයේ ආයතන මගින් පැවරී ඇති රාජකාරී පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර එම විෂයයන්ට අදාළ සිද්ධීන් සම්බන්ධව සිද්ධි අධ්‍යයනයක් ද ඇතුළත් වේ.

**15.2.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර :**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

| | |
|---|---|
| I කොටස | - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25) |
| II කොටස | - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි. (ලකුණු 75යි) |

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 30 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැදුර, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**උපලේඛනය I**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| කොළඹ | 1103 | 01 **කොළඹ** | 01 බස්නාහිර පළාත |
| කොලොන්නාව | 1106 | | |
| කඩුවෙල | 1109 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| හෝමාගම | 1112 | | |
| සීතාවක(හංවැල්ල) | 1115 | | |
| පාදුක්ක | 1118 | | |
| මහරගම | 1121 | 01 | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ | 1124 | | |
| තිඹිරිගස්යාය | 1127 | **කොළඹ** | |
| දෙහිවල | 1130 | | |
| රත්මලාන | 1131 | | |
| මොරටුව | 1133 | | |
| කැස්බෑව | 1136 | | |
| | | | |
| මීගමුව | 1203 | | |
| කටාන | 1206 | | |
| දිවුලපිටිය | 1209 | | |
| මීරිගම | 1212 | | |
| මීනුවන්ගොඩ | 1215 | 02 | 01<br>බස්නාහිර පළාත |
| වත්තල | 1218 | | |
| ජා ඇල | 1221 | | |
| ගම්පහ | 1224 | ගම්පහ | |
| අත්තනගල්ල | 1227 | | |
| දොම්පේ | 1230 | | |
| මහර | 1233 | | |
| කැලණිය | 1236 | | |
| බියගම | 1239 | | |
| | | | |
| පානදුර | 1303 | 03 | |
| බණ්ඩාරගම | 1306 | | |
| හොරණ | 1309 | | |
| ඉංගිරිය | 1310 | කළුතර | |
| බුලත්සිංහල | 1312 | | |
| මදුරාවල | 1315 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| මිල්ලනිය | 1318 | 03 කළුතර | 01 බස්නාහිර පළාත |
| කළුතර | 1321 | | |
| බේරුවල | 1324 | | |
| දොඩන්ගොඩ | 1327 | | |
| මතුගම | 1330 | | |
| අගලවත්ත | 1333 | | |
| පාලින්දනුවර | 1336 | | |
| වලල්ලාවිට | 1339 | | |
| | | | |
| තුම්පනේ | 2103 | 04 මහනුවර | 02 මධ්‍යම පළාත |
| පූජාපිටිය | 2106 | | |
| අකුරණ | 2109 | | |
| පාතදුම්බර | 2112 | | |
| පන්විල | 2115 | | |
| උඩුදුම්බර | 2118 | | |
| මිනිපේ | 2121 | | |
| මැදදුම්බර | 2124 | | |
| කුණ්ඩසාලේ | 2127 | | |
| ගඟවට කෝරළේ | 2130 | | |
| හාරිස්පත්තුව | 2133 | | |
| හතරලියද්ද | 2134 | | |
| යටිනුවර | 2136 | | |
| උඩුනුවර | 2139 | | |
| දොළුව | 2142 | | |
| පාතහේවාහැට | 2145 | | |
| දෙල්තොට | 2148 | | |
| උඩපළාත | 2151 | | |
| ගඟඉහළ කෝරළේ | 2154 | | |
| පස්බාගෙ කෝරළේ | 2157 | | |
| | | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| ගලේවෙල | 2203 | 05 මාතලේ | 02 මධ්‍යම පළාත |
| දඹුල්ල | 2206 | | |
| නාඋල | 2209 | | |
| පල්ලේපොල | 2212 | | |
| යටවත්ත | 2215 | | |
| මාතලේ | 2218 | | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | | |
| ලග්ගල පල්ලේගම | 2224 | | |
| විල්ගමුව | 2227 | | |
| රත්තොට | 2230 | | |
| උකුවෙල | 2233 | | |
| | | | |
| කොත්මලේ | 2303 | 06 නුවරඑළිය | |
| කොත්මලේ බටහිර | 2304 | | |
| හඟුරන්කෙත | 2306 | | |
| මතුරට | 2307 | | |
| වලපනේ | 2309 | | |
| නිල්දණ්ඩාහින්න | 2310 | | |
| නුවරඑළිය | 2312 | | |
| තලවකැලේ | 2313 | | |
| අඹගමුව | 2315 | | |
| නෝර්වුඩ් | 2316 | | |
| | | | |
| බෙන්තොට | 3103 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| බලපිටිය | 3106 | | |
| කරන්දෙණිය | 3109 | | |
| ඇල්පිටිය | 3112 | | |
| නියාගම | 3115 | | |
| තවලම | 3118 | | |
| නෙළුව | 3121 | | |
| නාගොඩ | 3124 | | |
| බද්දේගම | 3127 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| වඳුරඹ | 3128 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| වැලිවිටිය දිවිතුර | 3130 | | |
| අම්බලන්ගොඩ | 3133 | | |
| හික්කඩුව | 3136 | | |
| රත්ගම | 3137 | | |
| මාදම්පාගම | 3138 | | |
| කඩවත්සතර | 3139 | | |
| බෝපෙ පෝද්දල | 3142 | | |
| අක්මීමන | 3145 | | |
| යක්කලමුල්ල | 3148 | | |
| ඉමදූව | 3151 | | |
| හබරාදූව | 3154 | | |
| ගෝනපීනුවල | 3157 | | |
| | | | |
| පිටබැද්දර | 3203 | 08 මාතර | |
| කොටපොල | 3206 | | |
| පස්ගොඩ | 3209 | | |
| මුලටියන | 3212 | | |
| අතුරලිය | 3215 | | |
| අකුරැස්ස | 3218 | | |
| වැලිපිටිය | 3221 | | |
| මාලිම්බඩ | 3224 | | |
| කඹුරුපිටිය | 3227 | | |
| හක්මන | 3230 | | |
| කිරින්ද පුහුලුවැල්ල | 3233 | | |
| තිහගොඩ | 3236 | | |
| වැලිගම | 3239 | | |
| මාතර | 3242 | | |
| දෙවිනුවර | 3245 | | |
| දික්වැල්ල | 3248 | | |
| | | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| සූරියවැව | 3303 | 09 හම්බන්තොට | 03 දකුණු පළාත |
| ලුණුගම්වෙහෙර | 3306 | | |
| තිස්සමහාරාමය | 3309 | | |
| හම්බන්තොට | 3312 | | |
| අම්බලන්තොට | 3315 | | |
| අඟුණකොළපැලැස්ස | 3318 | | |
| වීරකැටිය | 3321 | | |
| කටුවන | 3324 | | |
| ඕකේවෙල | 3327 | | |
| බෙලිඅත්ත | 3330 | | |
| තංගල්ල | 3333 | | |
| වලස්මුල්ල | 3336 | | |
| | | | |
| කයිට්ස් | 4103 | 10 යාපනය | 04 උතුරු පළාත |
| වානක්කනි | 4106 | | |
| සන්දිලිපායි | 4109 | | |
| තෙලිප්පායි | 4112 | | |
| උඩුවිල් | 4115 | | |
| කෝපායි | 4118 | | |
| කරවෙඩ්ඩි | 4121 | | |
| මුරුතන්කර්නි | 4124 | | |
| පොයින්ට් පේද්‍රු | 4127 | | |
| චාවාකච්චේරි | 4130 | | |
| නල්ලූර් | 4133 | | |
| යාපනය | 4136 | | |
| වෙලනායි | 4139 | | |
| ඩෙල්ෆ් | 4142 | | |
| කරෙයිනගර් | 4145 | | |
| | | | |
| මන්නාරම | 4203 | 11 මන්නාරම | |
| මාන්තායි බටහිර | 4206 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| මඩු | 4209 | 11 මන්නාරම | 04 උතුරු පළාත |
| නානද්දාන් | 4212 | | |
| මුසාලි | 4215 | | |
| | | | |
| වවුනියා උතුර | 4303 | 12 වවුනියා | |
| වවුනියා දකුණ | 4306 | | |
| වවුනියා | 4309 | | |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | | |
| | | | |
| තුනුක්කායි | 4403 | 13 මුලතිව් | |
| මාන්තායි නැගෙනහිර | 4406 | | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | | |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | | |
| මැරිටයිම්පත්තු | 4415 | | |
| වැලිඔය | 4418 | | |
| | | | |
| පච්චිලෙයිපල්ලි | 4503 | 14 කිලිනොච්චිය | |
| කඳවලෙයි | 4506 | | |
| කරච්චි | 4509 | | |
| පූනාකරි | 4512 | | |
| | | | |
| කෝරළේපත්තු උතුර | 5103 | 15 මඩකලපුව | 05 නැගෙනහිර පළාත |
| කෝරළේපත්තු බටහිර | 5106 | | |
| කෝරළේපත්තු | 5109 | | |
| එරාවූර්පත්තු | 5112 | | |
| එරාවූර් නගරය | 5115 | | |
| මන්මුනේ උතුර | 5118 | | |
| මන්මුනේ බටහිර | 5121 | | |
| කාත්තන්කුඩි | 5124 | | |
| මන්මුනේපත්තු | 5127 | | |
| මන්මුනේ නිරිත | 5130 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පෝර්තිව්පත්තු | 5133 | 15 මඩකලපුව | 05 නැගෙනහිර පළාත |
| මන්මුනේ දකුණ | 5136 | | |
| කෝරළේපත්තු දකුණ | 5139 | | |
| කෝරළේපත්තු මධ්‍යම | 5142 | | |
| | | | |
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | 16 අම්පාර | |
| පදියතලාව | 5206 | | |
| මහඔය | 5209 | | |
| උහන | 5212 | | |
| අම්පාර | 5215 | | |
| නාවින්දවේලි | 5216 | | |
| සමන්තුරෙයි | 5218 | | |
| කල්මුණේ | 5224 | | |
| සයින්ද මුරුදූ | 5225 | | |
| කාර්තිවු | 5227 | | |
| නින්දවූර් | 5230 | | |
| අඩ්ඩාලච්චේන | 5233 | | |
| ඉරක්කාමම් | 5234 | | |
| අක්කරපත්තුව | 5236 | | |
| අලයඩිවෙම්බු | 5239 | | |
| දමන | 5242 | | |
| තිරුක්කෝවිල් | 5245 | | |
| පොතුවිල් | 5248 | | |
| ලාහුගල | 5251 | | |
| කල්මුණ උතුර උප | 5254 | | |
| | | | |
| පදවි ශ්‍රී පුර | 5303 | 17 ත්‍රිකුණාමලය | |
| කුච්චවේලි | 5306 | | |
| ගෝමරන්කඩවල | 5309 | | |
| මොරවැව | 5312 | | |
| නගර හා කඩවත් | 5315 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| තඹලගමුව | 5318 | 17 ත්‍රිකුණාමලය | 05 නැගෙනහිර පළාත |
| කන්තලේ | 5321 | | |
| කින්නියා | 5324 | | |
| මුතූර් | 5327 | | |
| සේරුවිල | 5330 | | |
| වෙරුගල් /ඉච්චලම්පත්තු | 5333 | | |
| | | | |
| ගිරිබාව | 6103 | 18 කුරුණෑගල | 06 වයඹ පළාත |
| ගල්ගමුව | 6106 | | |
| ඇහැටුවැව | 6109 | | |
| අඹන්පොල | 6112 | | |
| කොටවෙහෙර | 6115 | | |
| රස්නායකපුර | 6118 | | |
| නිකවැරටිය | 6121 | | |
| මහව | 6124 | | |
| පොල්පිතිගම | 6127 | | |
| ඉබ්බාගමුව | 6130 | | |
| ගනේවත්ත | 6133 | | |
| වාරියපොල | 6136 | | |
| කොබෙයිගනේ | 6139 | | |
| බිංගිරිය | 6142 | | |
| බමුණාකොටුව | 6149 | | |
| මාස්පොත | 6151 | | |
| කුරුණෑගල | 6154 | | |
| මල්ලවපිටිය | 6157 | | |
| මාවතගම | 6160 | | |
| රිදීගම | 6163 | | |
| වීරඹුගෙදර | 6166 | | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | | |
| කුලියාපිටිය බටහිර | 6172 | | |
| උඩුබද්දාව | 6175 | | |
| පන්නල | 6178 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| නාරම්මල | 6181 | 18 කුරුණෑගල | 06 වයඹ පළාත |
| අලව්ව | 6184 | | |
| පොල්ගහවෙල | 6187 | | |
| පඬුවස්නුවර නැගෙනහිර | 6190 | | |
| පඬුවස්නුවර බටහිර | 6193 | | |
| | | | |
| කල්පිටිය | 6203 | 19 පුත්තලම | |
| වනාතවිල්ලුව | 6206 | | |
| කරුවලගස්වැව | 6209 | | |
| නවගත්තේගම | 6212 | | |
| පුත්තලම | 6215 | | |
| මුන්දලම | 6218 | | |
| මහකුඹුක්කඩවල | 6221 | | |
| ආණමඩුව | 6224 | | |
| පල්ලම | 6227 | | |
| ආරච්චිකට්ටුව | 6230 | | |
| හලාවත | 6233 | | |
| මාදම්පෙ | 6236 | | |
| මහවැව | 6239 | | |
| නාත්තන්ඩිය | 6242 | | |
| වෙන්නප්පුව | 6245 | | |
| දංකොටුව | 6248 | | |
| | | | |
| පදවිය | 7103 | 20 අනුරාධපුරය | 07 උතුරු මැද පළාත |
| කැබිතිගොල්ලෑව | 7106 | | |
| මැදවච්චිය | 7109 | | |
| මහවිලච්චිය | 7112 | | |
| මධ්‍යම නුවරගම්පලාත | 7115 | | |
| රඹෑව | 7118 | | |
| කහටගස්දිගිලිය | 7121 | | |
| හොරොව්පොතාන | 7124 | | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| මිහින්තලේ | 7130 | 20 අනුරාධපුරය | 07 උතුරු මැද පළාත |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | | |
| නාච්චදූව | 7136 | | |
| නොච්චියාගම | 7139 | | |
| රාජාංගනය | 7142 | | |
| තඹුත්තේගම | 7145 | | |
| තලාව | 7148 | | |
| තිරප්පනේ | 7151 | | |
| කැකිරාව | 7154 | | |
| පළුගස්වැව | 7157 | | |
| ඉපලෝගම | 7160 | | |
| ගල්නෑව | 7163 | | |
| පලාගල | 7166 | | |
| | | | |
| හිඟුරක්ගොඩ | 7203 | 21 පොළොන්නරුව | |
| මැදිරිගිරිය | 7206 | | |
| ලංකාපුර | 7209 | | |
| වැලිකන්ද | 7210 | | |
| දිඹුලාගල | 7212 | | |
| තමන්කඩුව | 7215 | | |
| ඇලහැර | 7218 | | |
| | | | |
| මහියංගනය | 8103 | 22 බදුල්ල | 08 ඌව පළාත |
| රිදීමාලියද්ද | 8106 | | |
| මීගහකිවුල | 8109 | | |
| කන්දෙකැටිය | 8112 | | |
| සොරණාතොට | 8115 | | |
| පස්සර | 8118 | | |
| ලුණුගල | 8119 | | |
| බදුල්ල | 8121 | | |
| හාලිඇල | 8124 | | |
| ඌව පරණගම | 8127 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| වැලිමඩ | 8130 | | 08 ඌව පළාත |
| බණ්ඩාරවෙල | 8133 | | |
| ඇල්ල | 8136 | | |
| හපුතලේ | 8139 | | |
| හල්දුම්මුල්ල | 8142 | | |
| | | | |
| බිබිල | 8203 | 23 මොනරාගල | |
| මඩුල්ල | 8206 | | |
| මැදගම | 8209 | | |
| සියඹලාණ්ඩුව | 8212 | | |
| මොනරාගල | 8215 | | |
| බඩල්කුඹුර | 8218 | | |
| බුත්තල | 8221 | | |
| වැල්ලවාය | 8224 | | |
| කතරගම | 8227 | | |
| තණමල්විල | 8230 | | |
| සෙවණගල | 8233 | | |
| | | | |
| ඇහැලියගොඩ | 9103 | 24 රත්නපුර | 09 සබරගමුව පළාත |
| කුරුවිට | 9106 | | |
| කිරිඇල්ල | 9109 | | |
| රත්නපුර | 9112 | | |
| ඉඹුල්පෙ | 9115 | | |
| බලංගොඩ | 9118 | | |
| කල්තොට | 9119 | | |
| ඕපනායක | 9121 | | |
| පැල්මඩුල්ල | 9124 | | |
| ඇලපාත | 9127 | | |
| අයගම | 9130 | | |
| කලවාන | 9133 | | |
| නිවිතිගල | 9136 | | |
| කහවත්ත | 9139 | | |
| ගොඩකවෙල | 9142 | | |
| වැලිගෙපොල | 9145 | | |
| ඇඹිලිපිටිය | 9148 | | |
| කොලොන්න | 9151 | | |
| | | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| රඹුක්කන | 9203 | 25 කෑගල්ල | 09 සබරගමුව පළාත |
| මාවනැල්ල | 9206 | | |
| අරණායක | 9209 | | |
| කෑගල්ල | 9212 | | |
| ගලිගමුව | 9215 | | |
| වරකාපොල | 9218 | | |
| රුවන්වැල්ල | 9221 | | |
| බුලත්කොහුපිටිය | 9224 | | |
| යටියන්තොට | 9227 | | |
| දෙහිඕවිට | 9230 | | |
| දැරණියගල | 9233 | | |

02 - 87

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2026.01.02 | සිකුරාදා | 2025.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.09 | සිකුරාදා | 2025.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.16 | සිකුරාදා | 2026.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.23 | සිකුරාදා | 2026.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.30 | සිකුරාදා | 2026.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2026.02.06 | සිකුරාදා | 2026.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.13 | සිකුරාදා | 2026.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.20 | සිකුරාදා | 2026.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.27 | සිකුරාදා | 2026.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2026.03.06 | සිකුරාදා | 2026.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.03.13 | සිකුරාදා | 2026.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.03.20 | සිකුරාදා | 2026.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.03.27 | සිකුරාදා | 2026.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2026 ජනවාරි මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.